**ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ ගනුදෙනු පිළිබඳව වාර්තාව - 2022**

**-----------------------------------------------------------------------------------------**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයෙහි මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 20(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13(6) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2022 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයෙහි අධිකාරියේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් විසින්ම එම අස්ථිත්‍යය සම්බන්ධව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව, සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදි වන කාලසීමාවක් තුළ එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමඟ ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.
එම පනතේ 38 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව, වාර්ෂික වාර්තා සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීමට සිදුවන බව සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වගබලා ගනු ලැබිය යුතුය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් මාර්ගෝපදේශයෙහි 6.6 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2021 හා 2022 වර්ෂ වලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.2 වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්

අධිකාරිය විසින් අවසන් වරට පිළියෙල කරන ලද 2020 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම්, බැරකම් , ආදායම් හා වියදම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| **මූල්‍ය ප්‍රකාශන අයිතමය** | **වටිනාකම** |
|---|---|
| | **රු.** |
| <u>වත්කම්</u> | |
| ජංගම නොවන වත්කම් | 12,125,428 |
| ජංගම වත්කම් | 19,272,809 |
| **මුළු වත්කම්** | **31,398,237** |
| <u>ස්කන්ධය හා වගකීම්</u> | |
| ස්කන්ධය | 6,554,761 |
| <u>වගකීම්</u> | |
| ජංගම නොවන බැරකම් | 11,051,564 |
| ජංගම බැරකම් | 13,791,915 |
| **මුළු බැරකම්** | **31,398,240** |
| මුළු ආදායම | 55,811,496 |
| මුළු වියදම | 53,628,592 |
| **අතිරික්තය** | **2,182,904** |

## 2.3 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103 සහ 104 | • 2015 සිට 2019 කාලපරිච්ඡේදය තුල අධිකාරිය සතු රු.99,890ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් හා රු.61,900ක් වටිනා ටැබ් පරිගණක යන්ත්‍ර දෙකක් අස්ථානගත වී තිබුණද, ඒ | භාණ්ඩ අස්ථානගතවීම සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරන ලෙස විගණන හා කළමනාකරණ කමිටුව උපදෙස් ලබා දී ඇත. ඒ අනුව එයට අදාල කටයුතු මේ වෙන විට | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 103 සහ 104 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | ගනිමින් සිටී. | |
| | | • PD-6379 අංක දරන කැබ් රථය 2020 වර්ෂයේදී සභාපතිවරයා විසින් ධාවනය කරමින් සිටින අවස්ථාවේ ජලය ප්‍රමාණවත්ව නොයෙදීම මත වාහනයේ එන්ජිමට හානි සිදු වී තිබුණි. ඒ පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව සිදු කරන ලද පරීක්ෂණ වාර්තාවට අනුව අළුත්වැඩියාව සඳහා වැය වූ රු.498,110ක මුදල සභාපතිවරයාගෙන් අය කර ගත යුතු බවට නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද එම මුදල අයකර ගැනීමට අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී ද කටයුතු කර නොතිබුණි. | පිළිගන්නා අතර හිටපු සභාපති අධ්‍යක්ෂ ජනරාල්ගෙන් එම මුදල අය කරගැනීමට අවස්ථා කිහිපයකදී ලිපි මාර්ගයෙන් ඉල්ලීම් කලද ඒ සඳහා ප්‍රතිචාර නොලැබුණු බැවින් මේ පිළිබඳව ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී උපදෙස් ඉල්ලා සිටින ලදී. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා සිටිමු. | අයකර ගතයුතු බවට නිර්දේශ කරන ලද මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 395 (ඇ) | බැංකු ගිණුමක් ඇති සෑම ආයතනයක් විසින්ම එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, අධිකාරිය විසින් 2023 ඔක්තෝබර් 30 දින වන විටත් 2022 සහ 2023 වර්ෂයන්ට අදාළව බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි. | බැංකු සැසඳුම් පිළියෙළ කිරීම ආයතනයේ ගිණුම්කරණයේ ප්‍රධාන කාර්යක් වන අතර මෙහිදී අධිකාරියෙහි ගණකාධිකාරී මෙම කාර්යය නිසි පරිදි සිදු කර නොමැත. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි ගණකාධිකාරීට එරෙහිව විනයානුකූල ක්‍රියාමාර්ග ආරම්භ කොට ඇත. එහි ප්‍රගතිය ඉදිරියේදී දැනුම් දීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 502(2) | 11 වන පරිශිෂ්ටයේ සඳහන් පරිදි එක් එක් අංශ සතුව භාවිතයේ පවතින ස්ථාවර වත්කම් පිළිබද සම්මත වර්ගීකරණ ක්‍රමයක් අනුගමනය කර නොතිබුණු අතර ස්ථාවර වත්කම් සඳහා සංස්ථාමය සංකේත අංකයක් ලබා දී නොතිබුණි. එසේම | මේ වන විට ආයතනයේ සියලුම ස්ථාවර වත්කම් සඳහා අංකයක් හා ස්ථාවර වත්කම් ලේඛණ යාවත් කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ස්ථාවරවත්කම් ලේඛනයේ සඳහන් කොට ඇති වත්කම් වල භෞතික වශයෙන් ඇති ප්‍රමාණය ස්ථාවර වත්කම් ලෙජරය සමග සසඳා බැලීමක් සිදු කර නොතිබුණි. වත්කම් සම්බන්ධයෙන් වූ අභ්‍යන්තර පාලන ක්‍රම අනුගමනය නොකිරීම හේතුවෙන් අධිකාරියේ පවතින වත්කම් වල භෞතික පැවැත්ම සම්බන්ධයෙන් කළමනාකරණය වෙත තහවුරුවක් නොතිබුණු අතර වත්කම්වල ආරක්ෂාව සම්බන්ධයෙන් කළමණාකරණයේ නිසි අවධානය යොමු වී නොතිබුණි. | | |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 756. | අදාල මුදල් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම දෙසැම්බර් 15 දිනට පෙර සිදු කල යුතු අතර සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කිරීම ඉදිරි මුදල් වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම සිදුකල යුතු වුවද අධිකාරියේ 2022 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2023 මැයි 31 දින එනම් මාස 05ක ප්‍රමාදයක් සහිතව පත්කර තිබුණු අතර, එම භාණ්ඩ සමීක්ෂණ වාර්තාව, 2023 නොවැම්බර් 30 දින වන විටත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගන්නා අතර 2022 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත්කිරීම අධිකාරියේ කාර්ය මණ්ඩලයේ තිබූ හිඟ කම නිසා එදිනට සිටි කාර්ය මණ්ඩලය ආයතනයේ අනෙකුත් සංවර්ධන කටයුතු දීප ව්‍යාප්තව සිදු කිරීම සමඟ සම්බන්ධ වී කාර්යබහුලවී සිටි අතර ඔවුන් මෙම කාර්ය සඳහා සම්බන්ධ කර ගැනීමට අපහසු වීම හේතුවෙන් මෙම පත් කිරීම ප්‍රමාද විය. ඒ කෙසේවෙතත්, 2023 වර්ෂයේ මැද භාගයේදී 2022 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩලය පත් කිරීමට හැකියාව ලබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේක අනුව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 අංක 17 දරන ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය පනතේ 13 (ආ) සහ 13 (උ) වගන්ති අනුව අධිකාරියේ පහත සඳහන් අරමුණු ඉටුකර | | |

| | | | |
|---|---|---|---|
| | ගැනීම කෙරෙහි 2022 වර්ෂයේදී ද අවධානය යොමුකර නොතිබුණි. | | |
| | (i) පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විදේශ වෙළෙඳපලවල් ජයග්‍රහණය කිරීමට හැකි දේශීය ව්‍යවසායන් ජාත්‍යන්තරකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරි ගැන්වීම. | ව්‍යවසායන් ජාත්‍යන්තරීකරණය කිරීමේ අරමුණින් ව්‍යවසායන් ශ්‍රී ලංකාවෙන් පිට පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම උනන්දු කරවීම සඳහා දිරිගැන්වීමට විශේෂ වැඩසටහන් අධිකාරිය මගින් ක්‍රියාත්මක නොකලද දැනට ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් තුලින් වක්‍රව මෙම අරමුණ සඳහා දායක වෙයි. මෙම අරමුණ වෙනුවෙන්ම විශේෂයෙන් පිහිටුවා ඇති අපනයන සංවර්ධන මණ්ඩලයට අපගේ ව්‍යවසායකයින් යොමු කිරීම සිදුකර ඇත. කෙසේ නමුත් පනතෙහි සඳහන් මෙම අරමුණට අදාලව සංවර්ධන වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අධිකාරිය අපේක්ෂා කරයි. | පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| | (ii) තාක්ෂණික දියුණුව, නිෂ්පාදන සංවර්ධනය සහ පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල පර්යේෂණ සහ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සංවර්ධන අරමුදලක් පිහිටුවීම. | අධිකාරී පනතෙහි සඳහන් පරිදි මෙම තාක්ෂණික සේවා ලබාදීම මෙන්ම පේටන්ට් අයිතියේ වාණිජකරණයට අදාල තාක්ෂණය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා තාක්ෂණික අරමුදලක් ඇතිකිරීමට අධිකාරියට මේ දක්වා හැකියාව ලැබී නැත. මේ සඳහා මූලික අරමුදල් සපයා ගැනීමට ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සඳහා 2019 වර්ෂයේ යෝජනා ඉදිරිපත් කලද ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට හැකියාව නොලැබුණි. නමුත් ඉදිරියේදී මේ සඳහා යෝජනා සකස් කර අනුමැතිය ලබාගැනීමටත් ඒ තුලින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමටත් අධිකාරිය සැලසුම්කර ඇත. | පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ කාර්යයන්හි ප්‍රගතිය පහත සඳහන් පරිදි විය. | | |

| | | | |
|---|---|---|---|
| | (i) ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට අදාළ දත්ත පද්ධතියක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය යටතේ අවම වශයෙන් ව්‍යවසායකයින් 500,000ක් දත්ත පද්ධතිය සඳහා ලියාපදිංචි කර ගැනිමට සැළසුම් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුල කිසිදු ව්‍යවසායෙකු ලියාපදිංචි කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂය තුල ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ දත්ත පද්ධතිය තුල දත්ත 500,000ක් ඇතුළත් කිරීමට සැලසුම් කර තිබූ අතර දත්ත 260,000ක් ඇතුලත් කිරීමට හැකියාව ලැබුණි. මෙම පද්ධතියෙහි ඇති වූ තාක්ෂණික ගැටළු හේතුවෙන් ඉලක්ක ගත ප්‍රමාණය ඇතුළත් කිරීමට නොහැකි විය. වර්තමානයේ දත්ත පද්ධතියෙහි තාක්ෂණික ගැටළු යථාවත් කරමින් පවතී. | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| | (ii) සමාලෝචිත වර්ෂය තුල අවම වශයෙන් ව්‍යවසායකයින් 50 දෙනෙකු වෙත Made in Sri Lanka ලාංජන (logo) ලබාදීමට සැලැසුම් කර තිබුණද, එක් ලාංජනයක් හෝ ලබා දී නොතිබුණි. | තෝරාගත් ව්‍යවසායන් වෙත සන්නාමය පිරිනැමීම 2023 වර්ෂයේ සිදු කිරීමට නියමිතය.<br>සමාලෝචිත වර්ෂය තුල තෝරාගැනීමේ නිර්නායක විධිමත්ව සකස් කිරීම, සන්නාම ලාංඡනයේ ප්‍රතිලාභ ලේඛනය, අයදුම්කරුවන්ගේ ස්ථානීය පරික්ෂාව සඳහා අවශ්‍ය අයදුම්පත, ස්ථානීය පරික්ෂාව සඳහා අවශ්‍ය අයදුම්පත, නිරික්ෂණ පෝරමය මෙන්ම සන්නාම ලබාදීමේ විධිමත් ක්‍රම වේදයක් සකස් කරන ලදී. 2023 වර්ෂයේ සිට මෙම වැඩසටහන තුලින් නිසි ඉලක්ක සපුරාගැනීමට අධිකාරියට හැකියාව පවතී. | -එම- |
| | (iii) සමාලෝචිත වර්ෂය තුළ උපාධිධාරි ව්‍යවසායක උදානය වැඩ සටහන යටතේ උපාධිධාරි වියවසායකයන් 20 දෙනෙකු සඳහා මුලාධාර ලබාදීමට සැලැසුම් කර තිබුණද ව්‍යවසායකයින් 07 දෙනෙකු සඳහා පමණක් මුලාධාර ලබා දි තිබුණි. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාග්ධන වියදම් ලෙස රු. මි 40ක් වෙන්කර තිබුනද අධිකාරිය වෙත ලැබුනේ රු. මි. 14.8ක් පමණි. මේ නිසා සමාලෝචිත වර්ෂයේ මෙම වැඩසටහන වෙනුවෙන් රු.මි. 3.5ක් වෙන්කර තිබුනද අධිකාරිය වෙත ලැබුණු සීමිත ප්‍රතිපාදන මත උපාධිධාරීන් 07 දෙනකු සඳහා පමණක් මූලා ප්‍රදානයන් සිදු කිරීමට අධිකාරියට සිදු විය. | -එම- |
| (ඇ) | අධිකාරිය විසින් පුහුණු කිරීම් සහ මුලාධාර සැපයීම් මගින් සංවර්ධනය කරන වියවසායකයන් සම්බන්ධයෙන් කාලීනව පසුවිපරම් කිරීම හෝ ඇගයීම් කිරීම සඳහා ඇගයීම් නිර්ණායක හඳුන්වා දී නොතිබුණු අතර එක් එක් | ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදුකරන පුහුණු වැඩසටන් ක්‍රියාත්මක කිරීම මෙන්ම පසුවිපරම් කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රාජකාරි කටයුතු කරන ව්‍යවසාය සංවර්ධන නිලධාරීන් මගින් සිදුවෙයි. මෙහිදී මෙම වැඩසටහනට අදාලව ඉලක්ක කණ්ඩායම් වල පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම | ඇගයීම් නිර්ණායක හඳුන්වාදීම සහ ව්‍යවසායකයත්ව ප්‍රගතිය සම්බන්ධයෙන් ඇගයීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සංවර්ධන වැඩසටහනෙන් බිහි වූ ක්‍රියාකාරී ව්‍යවසායකයන් සංඛ්‍යාව ඔවුන්ගේ ව්‍යවසායකයත්ව ප්‍රගතිය සම්බන්ධයෙන් ඇගයීම් සිදු කරන බවට තහවුරු නොවීය. එබැවින් අධිකාරියේ ප්‍රධාන අරමුණ වූ ක්‍රියාකාරී ව්‍යවසායකයින් බිහි කිරීමේ අරමුණ ඉටුවීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් විගණනයේදී ඇගයීම් කිරීමට නොහැකි විය. | සංවිධානය සහ සියලු පසුවිපරම් කටයුතු සිදුකරන ආකාරය සම්බන්ධව සම්පූර්ණ දැනුම හා අවබෝධය ප්‍රාදේශීය නිලධාරීන් වෙත ලබාදී ඇති අතර ඒ අනුව ඔවුන් වැඩකටයුතු සිදු කරමින් පවතී. තවද ප්‍රාදේශීය නිලධාරීන් විසින් සියලු දත්ත හා තොරතුරු පවත්වා ගෙනයයි. ප්‍රතිලාභී ලේඛන මෙන්ම ගොඩනගන ව්‍යවසායකයින්ගේ දත්ත හා තොරතුරු ඔවුන් විසින් පවත්වාගෙනයයි. ප්‍රතිලාභීන් ඇගයීම හා පසුවිපරම් කටයුතු ඔවුන් විසින් සිදුකරන අතර 2024 වර්ෂයේ සිට ඒ සඳහා නිර්ණායක ඇතුලත් ආකෘති පත්‍රයක් හඳුන්වා දීමටද නියමිතයි. | |

**3.2 අත්තිකාරම් පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 න් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) ප්‍රකාරව නිලධාරියෙකුට ලබා දුන් අත්තිකාරම් මුදලක් දෙන ලද කාර්ය නිමකල විගසම පියවිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 173කදී ලබාදුන් රු.3,250,234ක අත්තිකාරම් සහ 2017, 2018, 2019, 2020 සහ 2021 වර්ෂ වල ලබා දුන් පිළිවෙලින් රු.82,000, රු.399,690, රු.48,000, රු.10,000, සහ රු.88,000ක අත්තිකාරම් 2022 දෙසැම්බර් 31 දිනවන විටත් පියවා නොතිබුණි. | මෙහි සඳහන් අත්තිකාරම් ලබාදී ඇත්තේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා කරනු ලබන වැඩසටහන් සඳහාය. අත්තිකාරම් මුදල් ලබාදීමේදී මෙහි සඳහන් චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි අනුව සිදුකරනු ලබන අතර පියවීම ප්‍රමාදවීම සම්බන්ධව අදාල ප්‍රදේශීය ලේකම් කාර්යාල සේවය කරනු ලබන සංවර්ධන නිළදාරින්ගෙන් කරුණු විමසා අත්තිකාරම් පියවීම නිසි වේලාවට පියවීමට උපදෙස් ලබාදී ඇත. මෙහි සඳහන් අත්තිකාරම් අවස්ථා 173න් 34ක් මේ වනවිට අත්තිකාරම් පියවා ඇති අතර ඉතිරි අත්තිකාරම් පියවීම සඳහා දැනටමත් ප්‍රදේශීය ලේකම් කාර්යාල දැනුවත් කොට ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අධිකාරිය සඳහා ISO සහතිකය ලබා ගැනීම සඳහා 2016 වර්ෂයේ රු.71,762ක් ද, 2017 වර්ෂයේ රු.125,000ක්ද, 2018 වර්ෂයේ රු.35,880ක්ද වශයෙන් එකතුව රු.232,642ක මුදලක් වැයකර තිබුණද සමාලෝචිත | පසුගිය වර්ෂවලදී කොවිඩ් බලපෑම හේතුවෙන් මෙම කටයුතු ප්‍රයෝගිකව සිදු කර ගෙන යාමට අපහසු වී ඇත. මේ සඳහා ආයතනයේ අභ්‍යන්තර ක්‍රියා පටිපාටින් අධිකාරිය විසින් සකස් කර ඉදිරිපත් කළ යුතුව තිබිණි. එසේම මෙම කටයුතු සඳහා තෝරාගත් ආයතනය | ISO සහතිකය කඩිනමින් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේදී ද ISO සහතිකය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සඳහා අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන් සකස් කර ඉදිරිපත් කිරීමට ඔහුන් විසින් මුදල් ඉල්ලා සිටීම හේතුවෙන් හා ඒ සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙනුත්, මෙම ක්‍රියා පටිපාටි සකස් කිරීම අභ්‍යන්තර වශයෙන් සිදු කිරීම සඳහා ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් නොසිටීම් හේතුවෙනුත් මෙම කටයුතු සිදු කිරීම ප්‍රමාද වී ඇත. එසේම, අදාල වර්ෂවල අවසන් ගිණුම් සැකසීම ප්‍රමාද වීම සිදු වී ඇති බැවින් ඒ පිළිබඳව විගණන කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ආයතනයේ තත්ව විගණනයක් සිදුකිරීමට නොහැකි වී තිබිණ. සමාලෝචිත වර්ෂය වන විට මෙම කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන කර නොමැත. | |
| (ආ) | ආයතන සංග්‍රහයේ 1 වන පරිච්ඡේදයේ 5,4,2 ට අනුව පුරප්පාඩු සුළු සංඛ්‍යාවක් සඳහා විශාල සංඛ්‍යාවක් අයදුම් කල විට, එම සංඛ්‍යාව 25 ට වැඩිවන අවස්ථාවලදී සෑම පුරප්පාඩුවකටම පස් දෙනෙකු (5) වන අනුපාතයට කැඳවනු ලබන සංඛ්‍යාව සීමා කිරීමට, පත් කිරීමේ බලධාරියාට හැකි වුවද, අධිකාරිය විසින් එක් ව්‍යවසායක ප්‍රවර්ධන නිලධාරී පුරප්පාඩුවක් සඳහා අයදුම් කරුවන් 119 දෙනෙකු, ව්‍යවසායක ප්‍රවර්ධන සහකාර පුරප්පාඩු 06ක් සඳහා අයදුම් කරුවන් 264 දෙනෙකු සහ කළමණාකරණ සහකාර පුරප්පාඩු 02ක් සඳහා අයදුම් කරුවන් 224 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවා තිබූ බවත් ඒ සඳහා තැපැල් ගාස්තු, සංග්‍රහ වියදම් සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සඳහා ගෙවීම් වෙනුවෙන් රු.122,875ක පිරිවැයක් දරා තිබුණි. | පිළිගනිමි. අධිකාරිය බඳවා ගැනීම සිදුකරනු ලබනේ මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියට වන අතර එහි මෙහි සඳහන් පරිදි ක්‍රමවේදයක් සඳහන් කර නොමැත. අයදුම් කර ඇති සුදුසුකම් ලත් සියලු අයදුම් කරුවන්ට සමාන අවස්ථා ලබාදීම සඳහා සුදුසුකම් ලත් සියලුම අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීමට බඳවා ගැනීමේ පරිපාටිය අනුව කළමනාකරණය තීරණය කරන ලදී. ඒ අනුව කටයුතු සිදු කර ඇත. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කල යුතුය. |